
# මතක සිත්තම



කේ.එස්.සෙනාදි නිශ්ශංක

# මතක සිත්තම


**කේ.එස්.සෙනාදි නිශ්ශංක**

**කර්තෘ**


*~ පළමු දිගහැරුම ~*


**මහාමායා බාලිකා විදුහල - මහනුවර**

**11 ශ්‍රේණිය**

**2025.02.08**

ISBN - 978-624-208-488-6

# ~පිදුම~

**ජීවිතයේ සරතස නිවූ**

**සෙනෙහසේ දිය උල්පත වූ**

**අම්මාටත්,**

**විලීනව ගිය ලේ නහර මත**

**ජීවයේ සිනහව තැවරූ**

**අප්පච්චීටත්,**

**වසන්තයේ මල් උයන වෙත යන්න**

**සෙනෙහසින් අත දිගු කළ**

**අක්කීටත්,**

**සෙනෙහසින්**

**පුදන්නෙමි....**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ,කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි .පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කර්තෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවදියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොවනුමාන ය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

වින්ටබෙරි කඳු පාමුල ඇති පුංචි නිවසෙහි වෙසෙන්නේ මාත් මාගේ අත්තම්මාත් වේ. මාගේ මේ පුංචි නිවස අවට වටපිටාව කියා නිම කළ නොහැකි ස්වභාව සෞන්දර්යයකි  පිරී ඇත. විටෙක මා හට එය පාළුව හා ගුප්ත බව කැටි වූ ලෝකයක් මෙන් සිතට නැගී ද සැබෑවටම එය පාළුවෙන් හා අත්භූත චමත්කාරයෙන් ම සිනා වී සිටින පුංචි නිවසකි. නිවසේ එක් කොනක වන ලැහැබට යන මාවත දිස් වූ අතර අනෙක් පසින් කඳු පාමුල සිට හතැප්ම ගණනාවක් දික් වූ 'පීර්ච්' නගරය වෙත යන මාවතයි. වන ලැහැබ අන්ධකාරයෙන් පිරී එකකි. එහි මහා අත්භූත ගැවසී ඇති බවට අත්තම්මා මා සමග කතාවට මෙන් කියා ඇතිමුත් එය මා ඇදිරි වැටෙන තෙක් වනයේ කාලය ගත කිරීම වැළැක්වීමට බව මා දනිමි.

මාගේ නිදහස ඇත්තේ ඒ වන ලැහැබෙහි වේ. පාළු පිටිසර බව මා ගත වෙළා ගෙන ඇතිමුත් අරණ තුළ වූ මිහිරි අමෘතයක් බඳු වූ කුරුලු ගී මාගේ පාළුවට බෙහෙත විය. වනය දෙකට බෙදමින් ගලා ගිය ගංගාවේ රැළි අදින දිය මාගේ නෙතට ප්‍රීතිය ගෙන දෙන්න විය. හිරු නගින හා බසින වින්ටබෙරි කඳු මුදුන මා හට ආලෝකය ගෙන දෙන්න විය. ඉතින් මා වෙළා ගෙන ඇත්තේ ඒ මනස්කාන්ත පාළුව තුළින් ම පෝෂණය වූ සොඳුරු ජීවන දර්ශනයකිනි.


මා අපේ පුංචි නිවසෙහි පාසි බැඳුණු ගල් පඩි දෙක තුනෙන් පහළට බැස්සේ අත්තම්මාගේ පින්තාරු කළ රූපයත් සමගයි. එය ඉතාමත් ආනාදිමත් කාලයකට පෙර ගත් ඇගේ සිතුවමකි. එහි ඇ ඉතාමත් රූමත් කාන්තාවක් වීද එලෙස පැහැබර මුහුණක් ඇගෙන් මා හට කිසි දිනෙක දිස් වී නැත්තේ මා ඇ සමීපයේ වෙසෙන විට ඇ තම ජීවිතයේ සැඳෑ සමයට ළං වෙමින් තිබූ නිසා විය යුතුය. නමුත් තවමත් ඇගේ රූමත්කමේ යම් යම් සලකුණු මුහුණේ දිස් නොවූයේ ද නැත. කෙසේ හෝ මා ළග වූ පරණ දිය සායම් පෙට්ටිය ද පින්සල ද හා පුංචි කඩදහි කොළය හා පින්තාරු කළ පුංචි රූපයද කුඩා මලුවකට දමා ගෙන සිටි මම එය වන  ලැහැබෙහිදී ඇඳීමේ අපේක්ෂාවෙන් ගල් පඩි මුල සිටි අත්තම්මාට පවසා වන ලහැබ වෙත පිය නැගුවෙමි.

වන ලැහැබෙහි කෙකටිය මලින් ගැවසුණු කුඩා දිය පොකුණක් ළග මා මාගේ ගමනාන්තය සනිටුහන් කළෙමි. ඒ අසබඩ වූ පැතැලි කළු ගලක් මත අසුන් ගත්

මා නිස්කලංක බව හා නිහඬත්වය තුරුළු කර ගනිමින් වන දෙව්ලියගේ සිරියාවේ නොනිමියාව දෙස මදක් නෙත් අයා බලා සිටියෙමි. එක් වරම මා ගත ආක්‍රමණය කරමින් හමා ගිය චණ්ඩ මාරුතය මා වන රොදට ඒමට මූලික වූ කාරණය, මා හට නැවත ආවර්ජනය කිරීමට සමත් විය. ඉක්බිතිව මා පින්සල පොකුණු දියේ තෙමා ඒ මේ අත ගැසීය. ඉන් පසු සායම් තීන්ත ගල්වා අත්තම්මාගේ පින්තාරු කල රූපය දෙස බලා එය සෙමින් සිතුවම් කරන්නට වීය.

සැබැවින්ම පාසලේදී මා චිත්‍ර කර්මයට දස්කම් පා ඇත. අපට චිත්‍ර උගන්වන හෙන්රි මහතා මා අඳින සෑම සිතුවමක්ම අන්අය ඉදිරියේ පැසසුමට ලක් කරන්නේ මාව මුරුංගා අත්තේ තබමිනි. කෙමෙන් කෙමෙන් සිතුවමේ අඩක් පමණ ඇඳ නිම කිරීමට හැකි විය. අඳුර වැටෙත්ම මා නැවත නිවස කරා යාමට සැරසුණි.

නමුත් හිරු කඳු මුදුනින් රතු පාට ගිනි බෝලයක් සේ බැසයත්ම මා හට මතකයට ආවේ අඳුරු වනය පසාරු කර ගෙන යන චණ්ඩ මාරුතයක් නිල් සළුවක් මෙන් රැළි නගන ගංගාවයි. මා නොදැනුවත්වම ගංගාව අසබඩට පිය නැගුවේ එය දැක ගැනීමට වෙනදා නොවූ ආශාව නිසා විය යුතුය.ගඟ අසබඩ වෙනදා නොවූ පාළුවක් මා හට දැනුණි. ගං ඉවුරේ වැදී හෙමිහිට ඇත් මැත් වන කුඩා බෝට්ටුවක් එහි නවතා තිබුණි. එහි චංචල බව දෙස මදක් නෙත් අයා බලා සිටි මට එය නොවැටුහුණු සැඟවුණු යමක් මාහට වටහා දීමට උත්සහ ගන්නා අයුරක් කියා පෑවේය. එය මාහට විටෙක කරදරයක් විය.



වන ලැහැබ පසාරු කර ගෙන ගලා ගිය ගගේ ඉමක් කොනක් නොපෙනුණි. රක්ත වර්ණයෙන් සැරසුණු හිරු මඬල ගිනි බෝලයක් සේ බැස යන විට විහිදෙන මනස්කාන්ත වෛවර්ණ හිරු එළිය මාගේ ඇසට පෙනෙන මානයේ තිබෙන ගං දිය මත වැටී සිත්කළු සිතුවම් මවා පාන්නට වූයේ මා හට සිනාසෙනවාක් මෙනි. මේ අපූරු දර්ශනයෙන් මෝහනය වූ මාහට අඳුර ගලා විත් පරිසරයම වෙළා ගන්නා බවට නොදැනුණි.

මා කඩිසර ගමනින් නිවහන සොයා පියනගනවාත් සමගම වන ලැහැබ සිසාරා හමන චණ්ඩ මාරුතයෙන් ගත හිරිපුඩු නැංවීය. නිවහන වෙත පියනගන මාවත වැරදී යැයි විටෙක මා සිතට ඇති වූ අවිනිශ්චිතභාවය සැම විටම මා ගෙන ගියේ අති බියකරු රාත්‍රියක් වෙතට ය. වේගවත් සුසුමක් හෙළූ මා සිතට ධෛර්යය ගෙන පියමං කර ද නිවසේ සිට ගංගාව තෙක් ඇති දුරටත් වඩා දුරක් මා පිය නගා ඇති බවට සැම විටම සිතට නැගෙන්නේ මන්ද යැයි මා නොදනිමි. මෙතරම් හුරුපුරුදු වනය මා හට වංචා කරනු ඇතැයි සිතීමවත් මම ප්‍රිය නොකරමි.

යම්තම් වැටුණු සඳ එළිය තිබුණ ද අද වනයේ දීප්තියක් නොමැත. ඝන මීදුම් පටල පවා දැන් සෙමින් සෙමින් වනය ආක්‍රමණයට ළං වී ඇත. මා හට තවමත්

නිවසට නිසි මග සොයා ගත නොහැකිය.කැළැඹීමට පත් වූ මම කිරීමට දෙයක් සිතා ගත නොහැකිව අසල වූ ගලක් මත වාඩි වූයෙමි.

මා හට බියකරු සිතිවිලි දාමයක් ගලා ආවේ අත්තම්මා නොයෙක් විට පවසා තිබූ අමුතු ආකරයේ විකාර කතා නිසා විය හැකිය. නමුත් මා ඒවා කිසි දිනෙක අඹ මල් රේණුවක් තරමටවත් ගණනකට ගෙන නැත. අත්තම්මා මා සොයා ඒ දැයි සිතීම මුග්ධකමකි. මන්දයත් ඇට මා සොයා ඒමට තරම් ඇගේ දෑස් පෙනෙන්නේ ද නැත. එසේම මා තරමටවත් මේ වනය හුරු නැති ඇය මේ අන්ධකාරයේ මා කෙසේ සොයා ගන්නීද?

මාගේ දෙනෙතින් කඳුළු කැට රූට ඒමට සූදානම් ය. මම අමතර වෑයමක් නොකොට ඒවාට වැගිරීමට ඉඩ දුන්නෙමි. එක්වරම මා සිහියට නැගුණේ මා අවසන් නොකළ අත්තම්මාගේ සිතුවමයි. මා හට නිවස සොයා ගැනීමට නොහැකි බව දැන් මා හොඳින්ම දනී. මා හට ඒ සඳහා තව දුරටත් වීර්යයක් නොමැත.

එසේ කියා සුසුම් හෙළමින් සිටීමට නොහැකි බව වැටහුණි.මා හට නැවත ගග අසබඩ යාමට සිත් වුණි. මේ නිසා මා උස් රුස්ස ගස් මැදින් වැටුණු මද චන්ද්‍රාලෝකය අවියක් කර ගෙන ගග කරා පිය නැගුවෙමි. විශාල රුස්ස ගස් හසින් ආවරණයක් නොලත් ගංගා නිම්නය මා හට සැනසීමකි.ඉක්බිති මාගේ දෑස් ගංගාවේ දිය සිප ගන්නා ආලෝකයෙන් දීප්තිමත් විය. රුය පහන් කිරීමට ගංගා නිම්නය මා හට යම් තරමකින් හෝ හුරුපුරුදු තැනකි.

මදනල වලින් ඇතිවන දිය රැළි නිසා ගං ඉවුරේ හැප්පී හැප්පී එහා මෙහා පැද්දෙන ලී බෝට්ටුව එලෙසම පැද්දෙමින් තිබුණි.මා එහි ළැගුම් ගැනීමට සිතුවෙමි.එම කුඩා බෝට්ටුව ලණුවකින් අසල වූ කුඩා ගල් පරයකට ගැට ගසා තිබුණි. එහි ඉදිරිපස කොනේ පුංචි ලාම්පුවක් දිස් විය. එහි අඩියේ භූමිතෙල් මදක් ඉතිරි වී ඇති බව මා දුටුවෙමි. නමුත් එය මා සඳහා ප්‍රමාණවත් වේ.

මා ගං ඉවුරේ ඇති පුංචි කළු ගල් කැට දෙකක් එකට ඇතිල්ලුවෙමි. අත්තම්මා මා හට ගල් අතුල්ලා ගින්දර පත්තු කර ගන්නා සැටි කියා දී තිබුණි. මා දැඩි පරිශ්‍රමයක් දරා ගින්දර පත්තු කර ගැනීමට සමත් විය. ඉන්පසු ලාම්පුවේ තිරය ඇද පත්තු කළෙමි. දැන් මා හට ප්‍රමාණවත් ආලෝකයක් තිබේ. මාගේ

මල්ලෙන් අඩක් නිම කරන ලද අත්තම්මාගේ සිතුවම රැගෙන එය සායම් කිරීමට පටන් ගත්තේ ලී බෝට්ටුව මත දිගාවෙමිනි.



ගං දියේ හෙමිහිට පැද්දෙන මේ බෝට්ටුව මා හට තොටිල්ලක ස්වරූපයක් මවා පෑවේය. මා හට කිසි දිනෙක තොටිල්ලක පහස ලැබී නැත. නමුත් අත්තම්මා මා උකුලේ තියා නළවා ඇති බව ඈ මා සමග පැවසූ ආකාරය මාගේ මතකයේ ඇත. විටෙක කරදරයක් ලෙස සැලකූ මේ බෝට්ටුව මා හට කිසි දිනෙක ළැගුම්පොළක් වේ යැයි මා නොසිතුවෙමි. ඝන අන්ධකාරයේ වීද භූමිතෙල් ලාම්පුවෙන් විහිදුණු පුංචි ආලෝකය මීදුම පසාරු කර ගෙන මද දුරක් ගොස් නැවතී තිබුණි. මා සායම් ගන්වා අත්තම්මාගේ සිතුවම ඇද අවසන් කළෙමි. ඉන්පසු පින්තාරු කළ රූපය සමග සසඳා බැලුවෙමි. සැබවින්ම මා හට තෘප්තියකට පත් වීමට හැකි තරමට මා එය සිතුවම් කර ඇත.

සිතට මද සතුටක් ගලා වීද වනයෙන් විටෙක ඇසුණු දෝංකාර හඬවල් එය පැහැරගෙන ගියේය. නමුත් මා නිර්භීතව මාගේ දෑස් දල්වා බලා සිටියෙමි. ලාම්පු ආලෝකය ද කෙමෙන් කෙමෙන් බෝට්ටුව අඳුරේ ගිල්වමින් අතුරුදහන් විය. මා අත්තම්මාගේ පින්තාරු කළ රූපය අතින් ගෙන සිප ගත්තෙමි. එහි දූවිලි බැඳුණු වීදුරුව මතට වැටුණේ කුඩා වැහි බිඳු ද මාගේ කඳුළු කැට ද යන්න අවිනිශ්චිත ය. මා අත්තම්මාගේ පින්තාරු කළ රූපය බදා ගෙන නින්ද තුරුළු කර ගතිමි.

“ඈන්! ඈන්! නැගිටින්න..මේරිත් එක්ක උද්‍යානයට යනවා කිව්වා නේද? කෝ..කෝ..නැගිටින්න..”

මාගේ මුහුණ ජනේලයේ වීදුරුව හරහා ගලා ආ සෞම්‍ය හිරු එළිය සිපගෙන තිබුණි.මා නැගිටින විට මා හට දැනුණේ අමුතු නුපුරුදු ගතියකි.පෙරදින මා සිටි බෝට්ටු ලෑලි කුෂන් මෙට්ටයකට පරිවර්තනය වී තිබුණි. නමුත් මා දුටුවේ සබැවටම සිහිනයක් ද? නැත. එය කිසිවිටකත් සිහිනයක් විය නොහැකිය. මට නැවතත් එදින රාත්‍රිය පහන් කොට අත්තම්මා දැක ගැනීමට ලැබේ නම් කෙතරම් සතුටක් ද? නමුත් එදින උදෑසන නැවත කිසිදිනෙක පහන් නොවනු ඇත. මන්ද අත්තම්මාගේ වියෝව සිදු වූයේ මීට වසර ගණනාවකට පෙරය. අත්තම්මාගේ වියෝවයෙන් පසුව මාහට ඉතිරි වූයේ ඇගේ පින්තාරු කළ රූපයක් පමණි.මා නින්දෙන් අවදි වන විට ඇයගේ එම පින්තාරු කළ රූපය දෑතින් බදා ගෙන සිටියෙමි. එයින් එන උණුහුම පොරෝනයෙන් දෙන උණුහුමට වඩා ශීතල පහ කරන බවට මම විශ්වාස කරමි.


අත්තම්මාගේ වියෝවෙන් පසුව මා හට චිත්‍ර කර්මය ඉගැන් වූ නගරයේ වෙසෙන හෙන්රි ඉස්කෝල මහත්තයාගේ නිවසෙහි ඔහුගේ මේරී නම් දියණිය සමග මා හදා ගැනීමට ඔහු කැමතී වී ඇත. ඒ අත්තම්මා ඇගේ වියෝවට පෙර ඔහු හට කර තිබුණු ඉල්ලීමකට අනුවයි.  ඒ බව මෑතකදී හෙන්රි මහත්තයා මා අමතා පවසා තිබේ. හෙන්රි මහත්තයා කරුණාභරිත හදවතක් ඇත්තෙක් විය. මා චිත්‍ර කර්මයට නිසගයෙන් ම දැක්වූ හැකියාව නිසා දෝ ඔහු මා වඩාත්ම ප්‍රිය කළ ගුරුවරයා විය. ඒ බව මා අත්තම්මා සමග නොයෙක් වර පවසා තිබුණි. ඇයගේ මෙවැනි ඉල්ලීමකට හේතුව මෙයද නැතිනම් මා චිත්‍ර කර්මයෙන් ඉදිරියට යනු දැකීමට ඇගේ සිතේ තිබුණු ආශාවද යන්න මා නොදනිමි. කෙසේ වෙතත් දැන් මා හට හෙන්රි මහත්තයා දක්වන සෙනෙහස, කිසිවිටකත් පිය සෙනෙහසකට දෙවැනි නොවන්නකි.

මේරිද මාගේ ම වයසේම ය. දැන් මා මෙහි පදිංචියට පැමිණ වසර හතරක් පමණය. මෙතරම් කාලයකට පසුව හෝ අත්තම්මා සමග ගත කළ ඒ සොදුරු ජීවිතයෙන් බිඳක් හෝ නැවතත් ආවර්ජනය කිරීම ගැන මා පෙර දින දුටු සිහිනයට ස්තූතිවන්ත විය යුතුය.ඒ විශාල වන ලැහැබෙහි ඝන අන්ධාකාරයේ පුංචි බෝට්ටුවක දැල්වෙන පුංචි ආලොකයක් මැද මීදුම වෙළා ගත් පාළුවක

තනිවුණු මා නැවත කිසිදා ඒ සොඳුරු මිහිරි හිමිදිරියේ සෞම්‍ය උණුසුම නොවිඳින්නාක් සේ අත්තම්මාගේ පහස ද නොලැබෙනු ඇත.

මා පින්තාරු කළ රූපය දෙස නෙත් ආයා බලා සිටියෙමි. මා පෙරදින දුටු පරිදි අත්තම්මාගේ සිතුවමක් චිත්‍රයට නැඟීමට මම සිතුවෙමි.ආමා සිතුවම ඇඳ එය මාගේ චිත්‍ර ගුරුවරයා වූ හෙන්රි මහත්තයාට ගොස් පෙන්වීය. ඔහු මා කිසිදා නොවූ විරූ ලෙස මහත් ප්‍රශංසාවට පත් කළේ එහි විශිෂ්ටත්වය වර්ණනා කරමිනි.

සැබැවින්ම එය අත්තම්මාගේ සොඳුරු වත මා ඉදිරියේ අව්‍යාජව මවා පෑවේ ය. එම සිතුවමෙ ඇගේ නෙත් තුළින් ඇගේ විඩාව පෙන්වීය. නමුත් ඇයගේ සිනහව, අසන්තෘප්ත ශෝකය මැද වූ තෘප්තිමත් බලාපොරොත්තුවක සොම්නස විහිදුවේය. එම සිතුවම එතරම්ම විශිෂ්ටය.



අත්තම්මාගේ දෑස් හොඳහැටි පෙනෙන කාලයේ ඇ මගේ සිතුවම් නොයෙක් වර පැසසුමට ලක් කර ඇත. ඇ ඒවා තුළින් ලැබුවේ ඉතා මිහිරි මෙන්ම අභිප්‍රාය සම්පන්න සතුටකි. මා චිත්‍ර ශිල්පයෙන් ඉදිරියට යනු දැකීම අයගේ එකම අපේක්ෂාව විය. ඈත අතීතයේ සිටම අත්තම්මා චිත්‍රයට නැඟීමට මා හට අවශ්‍ය වී තිබුණි. මේ වන විට මා එය සාර්ථක ලෙස මුදුන්පත් කොට අවසානය. අත්තම්මාගේ පින්තාරු කළ රූපයේ සහ මා ඇඳි සිත්තමේ ඇත්තේ එකම

වෙනසක් පමණි. පින්තාරු කළ රූපයේ ඈ සිටින්නේ අසන්තෘප්ත ස්භාවයකිනි. ඇගේ ජීවිතයේ සතුටකට සිටියේ මා පමණකි. ඇගේ ළමා කාලය මෙන්ම තරුණ අවධිය පාහේ දුක් කම්කටොළු පිරි දුෂ්කරභාවය ගැබ් වී තිබූ එකක් බවට ඈ කිහිප වරක් මා සමග කියූ ආකාරය තවමත් මා මතකයේ තැන්පත් ව ඇත. ඇයගේ මේ ස්වභාවයට හේතුව එය විය හැකිය.

නමුත් මා සිතුවම් කළ සිත්තමේ ඇගෙන් දිස්වන්නේ සන්තෘප්ත සොම්නසින් දිවි ගෙවන සොදුරු ගැහැණියකි. මා හට ඇට ප්‍රීතියක් ගෙන දිය හැකි එකම දෙය වූ ඒ ඇගේ මා පිළිබඳ තිබූ එකම බලාපොරොත්තුව ඉටු කොට ඇයව ප්‍රීතියෙන් සන්තෘප්ත කොට නැවත මේ සිත්තම දෙස බලන බව ඉටා ගත් මම, එම අත්තම්මාගේ සිත්තම එතෙක් ආරක්ෂාකාරීව තබා ගැනීමට, මා ගමේ ගෙවූ ජීවිතය හා සුසංයෝජනය වූ මතකයන්ගෙන් පිරි මාගේ වටිනා බඩු පිරි කුඩා ලී පෙට්ටියට ඇමුවෙමි.

ඉන්පසු මා, මාගේ කාමරයෙහි වූ අත්තම්මාගේ පින්තාරු කළ රූපය දෙස බලා සිටියෙමි. එහි දූවිලි බැඳුණු වීදුරුව මත රූට ගියේ මාගේ කඳුළු බවට මාහට දැන් නම් නිශ්චිත ය. ඇගේ දෙකොපුල් දිගේ මාගේ කඳුළු ගලා ගියේ ඇඳ අඩනා පරිද්දෙනි මා එය තදින් බදා ගත්තේ අත්තම්මා හඬණු දැකීමට මා කිසිවිටකත් කැමති නොවන නිසාය.

ඉන්පසු කෙසේ හෝ ඇගේ අභිප්‍රාය ඉටු කිරීමට මා මේරිත් සමග හෙන්රි ඉස්කෝල මහත්තයාගේ උපකාරය ඇතිව චිත්‍ර ශිල්පය මැනවින් ප්‍රගුණ කළෙමි. ඒ නිසාම චිත්‍ර කර්මය හැදෑරීමට මාහට පීර්ච් නුවර හොඳම කොලේජියට යාමට හැකියාව ලැබුණි. අත්තම්මාගේ අපේක්ෂාව ඉටු කිරීමට සමත් වීම නිසා මා හට ඇත්තේ අප්‍රමාණ සතුටකි. මා සමග කොලේජියට යාමට මේරිත් සුදුසුකම් ලැබුවා ය. මේරි තවදුරටත් මා හට මිතුරියක් නොවේ. ඈ මාගේම සහෝදරියක් වැනිය. හෙන්රි මහතා අප දෙදෙනාම පීර්ච් නගරයේ ඇතින් ඩීව් කොලේජියට ඇතුළත් කළේය.

අප දෙදෙනා කොලේජියේ නේවාසික ව සිටින්නේ එකම කාමරයක ය. අප දිනපතා ඇතින් විශ්ව විද්‍යාලයේ උස් කුළුණ වෙත පිය නගන්නේ ඉංග්‍රීසි ඉගෙන ගැනීමට ය. ඉංග්‍රීසි පාඩම මා හට තේරෙන්නේ නැති තරම්. ඒ වෙලාවේ මා කරන්නේ චිත්‍ර ඇඳීමයි. විටෙක බලි රූප විටෙක ගම ආදි

නොයෙක් විකාර සිතුවමට නගයි. ඒ දැක අපට ඉංග්‍රීසි උගන්නන ෆෙඩ් සර් මා හට හොඳටම කෑගසයි.විටෙක පන්තියෙන් එළියටද දමයි. නමුත් මේරි ඉංග්‍රීසි ඉගෙන ගන්නේ ඉතමත් ආශාවෙනි.

මාගේ ප්‍රියතම විෂය චිත්‍ර කර්මයයි. ඈතින් කොලේජියේ ප්‍රධාන පිවිසුම් මාවතේ මල් වවා අලංකාර කර ඇති විශාල උස් කුළුණ වෙත අප පියමං කරන්නේ චිත්‍ර ශිල්පය ඉගෙනීමටයි. පාසලේ හෙන්රි මහතා සේම කොලේජියේ කේන් විල්ගර් මහතා ද කරුණාවන්ත හදවතක් ඇත්තෙකි. ඔහු මා පැසසුම් කර ඇති වාර ගණන අපමණය. ඔහු පන්තියේ සියල්ලටම වඩා මා ඉදිරියෙන් තබයි. අනිකාට නොවූ විශේෂ සැලකිල්ලක් මා හට දක්වන්නේ මාගේ චිත්‍ර කර්මයට ඇති සහජ හැකියාව නිසා විය යුතුය.



මා දිනක් චිත්‍ර කර්ම වේලේදී පුංචි සිතුවමක් ඇන්දේ වර්ෂ අවසාන චිත්‍ර ප්‍රදර්ශනයට තෝරා ගැනීම සඳහා කේන් මහතා දුන් උපදෙස් පරිදි ය. සැබවින් ම එය ඝන අන්ධකාරයේ වූ වනාන්තරයකි. නමුත් මා කිසිදිනෙක ඇඳීමට බලාපොරොත්තු නොවූ අරණක් මාගේ තෙලි තුඩෙන් සායම් පොගවා වර්ණවත් කර ඇත. ඇත්තෙන් ම එය සිතුවම තුළ ආවේණික චමත්කාරයක් ගැබ් වී තිබේ.

මෙය ඇන්දේ මා නොව මාගේ සිත බවට නොයෙක් වර මා හට දැනෙයි. අනාදිමත් කලක වුව මගේ සිතේ තදින්ම ගැබ් වී ඇති ඒ මගේ සොඳුරු ගම්මානය හා ඒ තුළින් පෝෂණය වූ ජීවන අත්දැකීම මා හට කිසිදිනෙක අමතක නොවීම එයට හේතුව විය යුතුයි. සදාකල් ම එය මාගේ සිතේ පුංචි කොනක සැඟවී තිබෙන නිවහල් ලැගුම්පළක් වනු බවට නිසැකයි.

මා සමග තරගයට හිටියේ පන්තියේ ඕවින් ජෝන් නම් සිසුවා පමණයි. ඔහු ද මා මෙන්ම චිත්‍ර ශිල්පයට හපනෙකි. ඔහු ඉතාමත් පොහොසත් පවුලක බව සැවොගේ ම මතයයි. එම නිසාම ඔවුන්, ඔහු කෙරෙහි දක්වන්නේ අප්‍රමාණ ගෞරවයකි. ඒ ඔහුගේ ධනයටයි. ඔහුගේ ඉංග්‍රීසි උච්චාරණය විටෙක මා කනස්සල්ලට පත් කර මුත් මා හට නම් කිසි දිනෙක ඔහු කෙරෙහි එවැනි භක්තියක් පහල වන්නේ නැත.

කෙසේ හෝ දින තුනකට පසු කේන් මහතා මා වර්ෂ අවසාන චිත්‍ර ප්‍රදර්ශනයට තෝරා ගත් බවට දැනුම් දෙන ලදි. එවිට මා හට ඇති වූයේ අප්‍රමාණ සතුටකි. මා එදින නේවාසිකාගාරය වෙත ගොස් මේරි සමග මෙය කතා කලේ ඉහමත් ප්‍රීතියකිනි. එදිනට පසුදින මා හට කේන් මහතා වෙත මාගේ ප්‍රදර්ශනයට තබන සිතුවම භාර දිය යුතු විය.

මම එදා රාත්‍රියේ මා අඳින්නේ කුමන තේමාවක් යටතේ ද යන්න දිගින් දිගට ම කල්පනා කළෙමි. මේ වන විට මේරි නින්දට ගොස් තිබුණි. මෙම කල්පනාව මා රැගෙන ගියේ ඉතා හාත්පසින් ම වෙනස් ලෝකයක් වෙතයි. එනම් මාගේ ළමා කාලයටයි. මාගේ ළමා කාලය සොඳුරු අත්දැකීම්වලින් පිරුණු ඉතා සරල මෙන්ම විනෝදබර එකකි. එහි හුදු අත්තම්මා හා වනපියස අරක් ගෙන තිබුණ ද මා හට අවැසි වටිනා ම සම්පත් දෙක එය නිසා, එය මා ජීවිතයේ මිහිරිත ම කාලයයි. මෙම මතකාවර්ජනය මාව ගමේ හිරු බසින සන්ධ්‍යාවේ ගං දිය මත පාන වෛවර්ණ චමත්කාරයෙන් පිරි දසුන ඇඳීමේ අවසන් තීරණය වෙත ගෙන ගියේය.

මද වේලාවකට පසු මා එක් වරම බිත්ති ඔරලෝසුව වෙත බැලුවේ මාගේ දෙනෙතට නින්ද ආරාධනා කළ නිසා විය හැකිය. එවිට එහි අළුයම 1.00 සටහන් වී තිබුනි. එවිට මා සිටියේ හිරුගේ කාලරත්න සූර්ය කිරණගං දිය මත

සයම් ගන්වමිනි. මා සිතුවමේ අඩක් පමණ නිම කල පසු නින්දට යාමට සැරසුණි.

නමුත් ඒ සමගම මේරි ඇදෙන් නැගිට්ටේ යම් බියකරු සිහිනයක් දුටු පරිද්දෙනි. ඒ විගසම ඇගේ එක් අතක්, ඇගේ නිදියහනට යාබදව ඒ අසලින් ම තිබෙන මගේ මේසය මත වූ ඉටිපන්දමේ වැදුනේ ඉතාමත් අවාසනාවන්ත ලෙසය. එයින් ඇතිවූ ගිනි සිළුව කඩදහි කොළය මත ක්ෂණයෙන් පැතිර යමින් සිතුවමේ වූ කාලරක්ත සූර්යය කිරණ පසාරු කරමින් ගං දිය ආක්‍රමණය කළේ, මගේ හදවත ද එලෙසම දවාලමිනි. ගින්නවහා නිවා දැමූද, චිත්‍රයේ අඩක් පමණ දැවී ගියේ එක් නිමේෂයකිනි. මාගේ දාබිඳු කඳුළු කැට වලට පරිවර්තනය වෙමින් දෙනෙතින් රූටා වැගිරුණි.

හෙට උදෑසන මා මෙය කේන් මහතාට භාරදිය යුතු විය. මා වේලාසැනින්ම නැගිට චිත්‍රයේ අනෙක් කොටස අවසන් කිරීමට අපේක්ෂා කෙළෙමි. නමුත් දැන් මා සතුව නිම කිරීමට ඇත්තේ දෙනෙතින් ගලා එන කඳුළු පමණය.

“අනේ ඈන් මට සමාවන්න. මා අතින් ලොකු වැරැද්දක් වුනේ...අනේ මට සමාවෙන්න..” විගස ඇදෙන් බැසි මේරී පැවසුවේ කඳුළු පිරුණු දෙනෙතිනි. මාගේ මුවින් වචනයක් පිට කිරීමට තරම් ශක්තියක් මා හට නොවීය. මා මාගේ දෑස් දල්වා බලා සිටියේ දැවී ගිය සිතුවම දෙසය.මාගේ හෘදයේ ගැඹුරුතම හෘත් පේෂි පටල සංකෝචනය වන වේගය මා හට උහුලා ගත නොහැකි තරමට ම ඉහළ ගොස් තිබේ.

කෙසේ වෙතත් මාගේ ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය පිහිටෙන් මද වේලාවකින් පියවි සිහියට පැමිණි මා, “ ඒකට කමක් නැහැ මේරි... දැන් යමු නිදාගන්න” යැයි පැවසුවේ ඒ වේලෙහි මා හට තනිකමක අවශ්‍යතාව දැඩිව දැනුණු නිසාය. ඒ හැර නින්දක් මා අසලකවත් නොවීය. ඈ අකමැත්තෙන් වීද නොසන්සුන් සිතින් නිදි යහනට පිවිසුණේ මාගේ අවශ්‍යතාවය හඳුනා ගෙන විය යුතුය.

මා පිලිස්සී ගිය සිතුවම පසෙකින් තැබුවෙමි. දුක වැළඳ ගෙන නින්දට යාමට සැරැසුණු මා හට අත්තම්මා සිහි විය. මා කොලේජියට එන විට ද අත්තම්මගේ පින්තාරු කළ රූපය මගේ වටිනා බඩු ඇති පුංචි ලී පෙට්ටියට දමා රැගෙන ඒමට අමතක නොකළෙමි. මා කොලීජයට ආ පසු එම පින්තාරු කළ රූපය ලී

පෙට්ටියේ අසුරා තැබුවේ, එය විටෙක මා සිත අත්තම්මාගේ නිර්ව්‍යාජ සෙනෙහස උදෙසා පොරබදින සීතල යුද්ධයකට පොලඹවන නිසා විය යුතුය. මා විගස ගොස් එම පින්තාරු කළ රූපය ලී පෙට්ටියෙන් ගෙන වැළඳ ගත්තෙමි. සැමදාමමෙන් මාගේ හෘදයට සැනසීමක් ගෙන ඒමට අව්‍යාජත්වය කැටි වූ ඒ සොඳුරු අප්‍රාණික සිතුවමට හැකි විය.

ඒත් සමග ම මට එහි වූ තවත් සොඳුරු සිතුවමක් දෙස නෙත් යොමු වූයේ නොදැනුවත්වම ය. ඒ මා හෙන්රි මහතාගේ නිවසේ දී සායම් කළ අත්තම්මාගේ සන්තෘප්ත මිහිරි සිනහවෙන් හෙබි සොඳුරු සිතුවමයි. ඇගේ ඒ සිනහව මා නෙත ගැටෙත් ම මා හට සිහියට නැගුණේ එම සිතුවම ලී පෙට්ටියට දැමීමට පෙර මා සිත ගත් අධිෂ්ඨානයයි. එනම් ඇගේ එකම අපේක්ෂාව මුදුන්පත් කිරීමයි. මා දැන් ඇගේ අපේක්ෂාව ඉටු කිරීමට සමත් වී ඇත. දැන් ඇගේ මේ සැනසිලිදායක මධුර සිනහව සැබැවින් ම මාගේ පින්සල් තුඩින් වූ අතපසු වීමක් හෝ දෝෂයක් නොවේ. අත්තම්මාට සබැවින් ම මේ වන විට මා සිටින තැන බලා ප්‍රීතියෙන් සන්තෘප්ත විය හැකිය.

අත්තම්මාගේ මෙම සිතුවම තවමත් ආරක්ෂාකාරීව එහි තැන්පත් වී තිබේ. ඇතීන් ඩීව් කොලේජියේ වර්ෂ අවසාන චිත්‍ර ප්‍රදර්ශනයේ එක් සිතුවමක් ලෙස පුංචි දූවිලි කැට ගැවසුණු වීද, ඊට වඩා මතක තුහීන බිඳු රැසක ආවර්ජනයක් වූ මෙම සිතුවම සුදුසු නොවේ ද? මා රැකීමට ඇ ගත් අපමණ වෙහෙසට පිදිය යුතු තිළිණය මෙය නොවේ ද? මා මගේ පෙර සිතුවම දවාලීම ගැන දෛවයට තුති පල කරමි. මම, මගේ කඳුළු නම් වූ අපූරු සායම තුළින් හැඩ වුණු අත්තම්මාගේ මතක සිත්තම අතට ගත්තෙමි.

......නිමි.....



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධ අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දාහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතා වෙනුවෙන් වසර ගණනාවක අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදිශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි

. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවෙකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පයේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසී පුංචි ගත්කතුවර ඔබගේ ලේඛණ දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-488-6